# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මිනුවන්ගොඩ සිංහ පදනම
## (සංස්ථාගත කිරීමේ)

**මිනුවන්ගොඩ සිංහ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා විසින්
2011 ඔක්තෝබර් මස 18 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 සැප්තැම්බර් මස 19 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[130 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 006294—750 (2011/10)

## මිනුවන්ගොඩ සිංහ පදනම
## (සංස්ථාගත කිරීමේ)

**මිනුවන්ගොඩ සිංහ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"මිනුවන්ගොඩ සිංහ පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව එකී පදනම සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද ඒ පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2011 අංක  දරන මිනුවන්ගොඩ සිංහ පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මිනුවන්ගොඩ සිංහ පදනම සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) මිනුවන්ගොඩ සිංහ පදනමේ දැනට සාමාජිකයන්ව සිටින හා සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මිනුවන්ගොඩ සිංහ පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද, එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) අඩු වරප්‍රසාදලාභී පුද්ගලයන්ට, පවුල්වලට හා ජන කොටස්වලට ආධාර කිරීම;

2—PL 006232—75 (2011/09)

(ආ) රැකියා අහිමි වීම, රෝගී වීම, අබල දුබලතාවයට පත් වීම, මරණය හෝ වෙනත් හේතූන් නිසා අසරණ වූ කම්කරුවන්ගේ, ගොවීන්ගේ පවුල්වලට සහ එවැනි වෙනත් අයට ආධාර කිරීම;

(ඇ) ස්වේච්ඡාවෙන් සේවයෙන් අයින් වූ, විශ්‍රාම ගියා වූ හෝ විදේශ රැකියාවලින් ආපසු පැමිණි කම්කරුවන්ට තම ඉතිරිකිරීම් පාලනය කර ගැනීම හෝ කුඩා පරිමාණයේ ව්‍යාපාර පටන් ගැනීම පිළිබඳව උපදෙස් දීම හා ආධාර කිරීම;

(ඈ) විදේශ රැකියාවල නියුතු කම්කරුවන්ගේ පවුල්වලට ඔවුන්ගේ සුභ සිද්ධිය සඳහා උපදේශන සේවා සැපයීම හා ආධාර කිරීම;

(ඉ) ව්‍යාපාර වැසීම, සේවකයන් අඩු කිරීම, සේවකයන් අධික වීම හෝ වෙනත් හේතු නිසා රැකියා අහිමි වූ කම්කරුවන්ට ස්වයං රැකියාවල යෙදීම සඳහා ආධාර කිරීම;

(ඊ) රැකියාවේ ප්‍රශ්න විසඳා ගැනීමට හා අයිතිවාසිකම් සහ ගෘහස්ථ පරිසරය පිළිබඳව කම්කරුවන්ට හා පවුල්වලට උපදේශන සේවා සැපයීම හා ආධාර කිරීම;

(උ) මානසික දුබලතාවයන්ගෙන් යුත් පුද්ගලයන්ට උපදේශන සේවාවන් පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඌ) අඩු වරප්‍රසාදලාභී තරුණ තරුණියන්ට ස්වයං රැකියාවල යෙදීමට හෝ වෙනත් රැකියා ලබා ගැනීම සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම හෝ වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ සහාය වීම;

(එ) අඩු වරප්‍රසාදලාභී පවුල්වලට නිවාස ලබා දීම හෝ නිවාස ලබා දීමට සහාය වීම හෝ නිවාස වැඩිදියුණු කර ගැනීම සඳහා සහාය වීම;

(ඒ) අඩු වරප්‍රසාදලාභී කාන්තාවන්ගේ හා ළමයන්ගේ පෝෂණ තත්ත්වය පිළිබඳ විශේෂ අවධානයකින් යුතුව මහජන සෞඛ්‍ය දියුණු කිරීම;

(ඔ) දුම්පානයෙන්, මත්පැන්වලින්, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමෙන් වැළැක්වීම සහ ඉහත කී දේවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම;

(ඕ) පරිසරය ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම;

(ක) ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාවේ පාලක සභාව විසින් අවශ්‍ය යයි ද යෝග්‍ය යයි ද අදහස් කරනු ලබන ආනුෂංගික වන්නා වූ ද ක්‍රියාවන් ඉටු කිරීම.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන දෑ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය:— සංස්ථාවේ බලතල.

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නියාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට කෙළින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ නියෝජිතයකු මාර්ගයෙන් ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඇ) මුදලින් හෝ ද්‍රව්‍යවලින්, ත්‍යාග, පරිත්‍යාග සහ රික්තවරණ භාර ගැනීම;

(ඈ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන මුදල් සුදුසු යයි සංස්ථාව විසින් සඳහන් කරනු ලබන ආකාරයකට සහ එසේ සුදුසු යයි සලකනු ලබන ඇප මත මුදල් අත්තිකාරම් දීම හෝ ණයට දීම හෝ ණයට ගැනීම;

(ඉ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, භාර ඇති කිරීම සහ පරිපාලනය කිරීම සහ යම් බැංකුවක ජංගම තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම;

(ඊ) පොත්, වාර ප්‍රකාශන, සඟරා සහ වෙනත් ලිපි ලේඛන පළ කිරීම හෝ පළ කිරීමට කටයුතු යෙදීම සහ පුස්තකාල, පොත් සාප්පු සහ මුද්‍රණාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(උ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාම, ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නියම කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සහ ආනුෂංගික හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ සභාපතිවරයා, උප සභාපතිවරයා, ලේකම්වරයා, උප ලේකම්වරයා, භාණ්ඩාගාරික, උප භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන වෙනත් සාමාජිකයන් පහළොස් දෙනකුගෙන් සමන්විත (මෙහි මින් මතු “මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් මේ පනතේ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස් වීම හෝ ඔවුන් නෙරපීම;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස් වීම හෝ ධුරය හිස් කිරීම, ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්යය;

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, එහි බලතල, චර්යාව සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය සහ මණ්ඩලයේ සාමාජිකයන්ගේ පුරප්පාඩු පිරවීම;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය හා කර්තව්‍ය;

(ඉ) මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන හා රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය;

(ඊ) සංස්ථාවේ දේපළ, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමකදී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

7. සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරික යන දෙදෙනාගෙන් එක් අයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අය විය යුතු සියලු ණය හා පදනම වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

9. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාර ගන්නා ලද හෝ මින් මතු භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක

මුදල්, ගාස්තු හෝ ප්‍රදාන මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේදී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. විගණනය හා ගිණුම්.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.